# වල්ගම කැඩුම් බිඳුම් වෙදපරපුරේ විශේෂිත ස්වේද කර්ම විධි

පාරම්පරික වෛද්‍ය රොෂානි තමරා වීරතුංග

ඈත අතීතයට දිව යන දේශිය වෛද්‍ය විද්‍යාව තුළ එදා මෙදාකළ දස්කම් විස්කම් පිලිබදව අද මුලු ලෝකයාගේ ම අවධානයට මේ වන විට ලක්ව ඇත. මෙම ලිපියෙන් අවධානයට ලක්කරනුයේ වල්ගම කැඩුම් බිඳුම් වෙද පරපුරෙහි පැවති ස්වේද කර්ම කල ආකාරයත් ඒ සදහා භාවිතා කරන ලද ඖෂධ හා ප්‍රතිකාර ක්‍රම පිළිබඳවත් ය. මෙම ලිපියෙන් අනාවරණය කරනුයේ ලණු වැල් වලින් සමන්විත විශේෂිත ලණු ඇඳ කැඩුම් බිඳුම් ප්‍රතිකාරය සඳහා භාවිත කල ආකාරය යි. එම පරපුරේ වෛද්‍යවරුන් එම වැල් ඇඳ වටා ඝන රෙදි වලින් ආවරණය කර රෝගියා එම ඇඳ මත තබා බෙහෙත් ඖෂධයන් ගෙන් සමන්විත මුට්ටියක් රෝගියා ගේ රෝගී ස්ථානයට තබා ස්වේද කර්ම කලහ. එහෙයින් එම පරපුරේ වෛද්‍ය වරුන් අදහස් කලේ රෝගී වූ ස්ථානය තැලුම් සහිතව නම් එම තැලුම් ස්ථානයේ ලේ කැටි පවතී නම් එය විසුරුවා හැරීමය මීට අමතරව මස් පිඩු ශක්තිමත් කිරීමත් ස්නායු ප්‍රාණවත් කිරීමත් අස්ථි වටා ආසාදන තත්වයන් වලක්වා ලීමට ත් එම ස්ථානයේ ඉදිමුම ඉවත් කර ගැනීම ත් ඖෂධ ඉක්මනින් රෝගී ස්ථානය කරා ගමන් කරවීම ත් මෙමගින් බලාපොරොත්තු වූහ.

මේ ආකාරයට සකස් කරන ලද තවත් විශේෂ ලෑලි යොදා ආවරණය කරන ලද ලණු වලින් නිර්මාණය කරන ලද ඇඳකි, මෙම ඇඳ සඳහා භාවිතා කරන ලද දැව අතර කොස්, කරුවල, කොහොඹ, තේක්ක සහ රුක් අත්තන ආදී දැව වර්ග භාවිත කරන ලදී. මීට අමතරව විශේෂිත වූ පුටු වර්ග රෝගීන් වෙනුවෙන් භාවිත කළහ. උසින් යුක්තව නිර්මාණය කරන ලද පුටුවට රෙදි වලින් ආවරණය යොදා ඖෂධ මුට්ටියක් එම රෝගීයාගේ රෝගී වු ස්ථානයට තබා මෙම ප්‍රතිකාරය කරන ලදී. මීට අමතරව වහලේ එල්ලන ලද ලනු පොටවල් දෙකකට පහළින් ලීයක් තබා ( ඔන්චිල්ලාවක ආකාරයෙන් ) අත්ල දක්වා සකස් කරන ලද උපකරණයක් ස්වේද කර්ම කිරීම සදහා භාවිතා කරන ලදී.

ඉහත ආකාරයට සකස් කර ගත් තවත් ස්වේද කර්ම විධියක් පාදවල ස්වේද කර්ම සඳහා ද භාවිතා කළහ. මීට අමතරව ඖෂධ මුට්ටි නිසි ආකාරයට පහසුවෙන් තැබිම සදහා ද උපකරණයක් භාවිතා කළහ. එමගින් ඉතා පහසුවෙන් එම උපකරණය භාවිතා කර ඖෂධ මුට්ටිය නිසි තැන තැබිම කළහ. මේ සඳහා භාවිතා කරන ඖෂධයන් එක් එක් රෝගයන් අනුව වෙනස් වේ.

**ශීරෝ රෝග සඳහා**
කටුවැල් බටු ,බටු දළු, ඉගුරු අල , කොත්තමල්ලි, නික, එරඬු, ආඩතෝඩ, දෙහි, යකිනාරං කොළ, සැවැන්දර මුල්, බැබිල මුල්, මානෙල් අල, හාතවාරිය අල, කොට්ටන්, තිප්පිලි, කලාදුරු අල, සූරියකාන්ත කොල සහ ඇට, වැල් මී ,කුරුඳු කොළ, ගම්මිරිස් කොළ, කරාබුනැටි කොළ, අඹ කොළ, කොහොඹ කොළ, සියඹලා ආදි කොල වර්ග සහ ඇට වර්ග ද අල වර්ග ද භාවිතා කළහ.

**චර්ම රෝග සඳහා**
අත්තික්කා, රත්කීරිය, රත් හඳුන්, බෝපොතු , මාදම් පොතු , නුග කොළ පොතු , වට්ටක්කා කොළ, පින්න කොළ, ගස්ලබු කොළ, ඇහැල දළු හා පොතු , සූරිය කොළ, නිවිති කොළ, එරබදු කොල පොතු ,රත්මල් කොළ, මකුලත, නිදිකුම්බා, වෙනිවැල් ගැට, රසකිඳ, ඉරමුසු ,වදකහ, කොහොඹ කොළ, බෙලි කොළ, කරල්සැබෝ ,වැල්පෙනෙළ, මුකුණුවැන්න, අනිත්ත කොළ, උදුපියලිය, ඇත්තෝර කොළ, අමුකහ, පේර කොළ , සියඹලා, දොඹ කොළ, කරවිල කොළ, ගිරිසීඩියා කොළ, කීකිරඳිය, ලුණුවිල , ගොටුකොළ, සප්සඳ ආදී ඖෂධ භාවිත කරන ලදී.

**වාත රෝග සඳහා**

නික, එරඬු, ආඩතෝඩ, නිකකොළ සහ ඇට, දොඹ ඇට සහ කොළ, දෙහි, ගම්මිරිස්, කරාබු නැටි, බෙලි ,අඹ, ඇඹරැල්ලා කොළ, බිලිං කොළ, වදකහ, හින් අරත්ත, අමුක්කරා අල, වදුරු මෑ ඇට, මසන් ඇට හා මද, කොල්ලු ඇට, උඳු, තිපත්, අතසි අල, කොට්ටන්, සතකුප්ප, දේවදාර ආදී ඖෂධ භාවිත කරන ලදී.

**මූත්‍ර ව්‍යුහගත රෝග සඳහා**

ගොකටු ඇට මද, ඇසල , කොත්තමල්ලි, ගල් සෙවල , ඊතණ, යවාස, ඔලිඳ කොළ සහ ඇට, පත්පාඩගම්, අරළු, පොල්පලා, කොහිල අල , කර්කටකශෘංගි, තීරස්සවාලු, සුවදකොට්ටං, ඉලුක්, අක්කපාන කොළ, උක්මුල්, රණඋණ මුල්, වැලුක් ,එනසාල්,ශිලාජතු , ලුණුවරණ පොතු ,හින් නෙරෙංචි, නීරමුල්ලිය ආදිය භාවිතා කර ස්වේද කර්ම සිදු කරන ලදී.

**ලිංගාශ්‍රිත රෝග සඳහා**

තෝර කොළ, ආඩතෝඩ කොළ, අමුකහ, එරඬු, කොල්ලු, දෙහි කොළ, නික, වරාකොළ, කුඹුරු දළු, සුදුලූණු, මුරුංගාකොළ පොතු , කටුකරඬු, රතුළූණු මේවා ආදිය භාවිත කරන ලදී.

**මේදෝ වෘද්ධි ( කොලෙස්ටරෝල් ) රෝග සඳහා**

බෙලි, කරපිංචා, කුරුඳු පොතු කොළ, දොඩම් කොළ, හීන් නාරංකොළ, නස්නාරං ,යකිනාරං, සියඹලා, ගොරක කොළ, අසමෝදගම් ඇට, කොත්තමල්ලි, නෙල්ලි , පෙනෙල වැල්, ඉගුරු, සුදුළූණු, සුදුරු, බෑබිල , ගම්මිරිස්, කරාබු නැටි, සේර කොළ භාවිත කරන ලදී.

**හෘද රෝගීන් සඳහා**

සේර කොළ, ඉඟුරු අල , ආඩතෝඩ, කුරුඳු, ගම්මිරිස්, කරාබු නැටි, කාමරංකා කොළ, ඇඹරැල්ලා කොළ, නස්නාරං කොළ, බෑබිල , නික, ඔලිඳ වැල් ,දොඩම් කොළ ( පැෂන් ෆෘට් ), කෝවක්කා, කුඹුක් පොතු , සුවද කොට්ටං, වැල් මී, අමුක්කරා අල , දේවදාර, අක්කපට්ට, බෙලි, නික, එරඬු, කාසි පෙති භාවිත කරන ලදී.

**ස්වේද කර්ම කළ වෙනත් රෝග**

මීට අමතරව අති ස්ථූල බව ගල් තැල්ම , ගෙඩි වණ,, කැඩුම් ,පක්ෂාඝාතය ( අංශභාගය ) ස්නායු රෝග , සෙම් රෝග , ආම වාත , සන්ධි රෝග , සර්ප විෂ , රූපලාවන්‍ය , උඳුගොච්චන් කෑම , ඉස්හොරි , සූප්ති ආදී රෝග , අස්රී පද්ධතිය ආශ්‍රිත රෝග සඳහාද ස්වේද කර්ම භාවිත කරන ලදී.

**ස්වේද කර්ම නොකල යුතු රෝග**

අධිරුධිර පීඩන රෝගීන්, වයෝවෘද්ධ රෝගීන්, ගලගණ්ඩ රෝගීන්, ගොලු අය, මානසික රෝගීන් , බිහිරි අය, කුස ගින්නෙන් පෙළෙන අයට, උණ රෝගයෙන් පෙළෙන අයට, කුඩා ළදරුවන්ට, ස්වේද කර්ම නො කළහ.

**ඖෂධ නිෂ්පාදනය කරන ආකාරය**

බෙහෙත් කිරීම සඳහා යෝග්‍යතාවය බලා නැකැත් හා වෛද්‍ය ජෝතිෂය භාවිතා කරමින් ප්‍රතිකාර කරන ලදී. සඳුදා දින බුද දින ගුරු දින බටහිර බලා ත් ප්‍රතිකාර කරන ලදී. විශේෂයෙන් හිරු උදාවට පෙර කාලය බෙහෙත් කිරීම සඳහා ගනු ලැබූහ. රාහු කාලය ආදිය බලා රෝගීන්ට ප්‍රතිකාර යෙදීමත් නැකැත් අනුව බෙහෙත් වර්ග තෙල් වර්ග සෑදීමත් කරනු ලැබූ අතර රොගියාගේ කේන්ද්‍ර සටහන පරික්ෂා කර බලා ඒ අනුව සුදුසු දින වකවානු සොයා බලා ප්‍රතිකාර ආරම්භ කිරීමද මෙම පරපුරේ පැවති තවත් විශේෂ චාරිත්‍රයකි.